**ශීර්ෂය 206 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජුනි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (ආ) i | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව ගිණුම්ගත නොකළ 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි 06 ක්, තක්සේරු අගය රු.5,000,000 ක් වූ වාහන 02 ක් හා හෙක්ටයාර් 3.348 ක් වූ ඉඩම් 05 ක් පිරිවැයට හෝ තක්සේරු වටිනාකම මත ගිණුම්ගත කළ යුතුය. | 1.6.1(ආ) |
| 1.6.1(අ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමෙහි හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන රු.444,761 ක වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1(අ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමෙහි හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර 2004 වර්ෂයට පෙර සිට පැවත එන රු.444,761 ක වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2004 වර්ෂයට පෙර සිට පැවත එන රු.444,761 ක් වූ එම වෙනස මේ වන විටද පරීක්ෂා කෙරෙමින් පවතින අතර 2024.12.31 දිනට ගිණුම් සැකසීමට පෙර එම කාර්යය අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | එම වෙනස හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

(ආ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 8.2 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම් ඒවා නිසිපරිදි හඳුනාගෙන පිරිවැයට හෝ තක්සේරු කළ අගයට ගිණුම්ගත කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කරනු ලබන ගොඩනැගිලි 06 ක් පවරාගෙන ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. තවද රු.5,000,000 කට තක්සේරු කරන ලද වාහන දෙකක ද අයිතිය පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය දෙපාර්තමේන්තුව වෙත පැවරූ වහාම ගිණුම් ගත කිරීමට පියවර ගෙන, අදාල පරිදි තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසු විගණනයට වාර්තා කිරීමට හා 2024 අවසන් ගිණුම් සඳහා ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් උපයෝජනය කරනු ලබන වත්කම්වල අයිතිය පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඒකක විකුණුම් මිල රු.5,300 ක් වූ සිංහල ඉංග්‍රීසි සංක්ෂිප්ත ශබ්දකෝෂ ප්‍රථම භාගයේ පිටපත් 62 ක් පරිත්‍යාග ලෙස බෙදා දී තිබුණු බවට නාමලේඛනයක් ඉදිරිපත් කර තිබුණ ද, රු.227,900 ක් වටිනා පිටපත් 43 ක් භාරගත් බවට වූ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වළක්වා ගැනීමට නිසි අධීක්ෂණයක් යටතේ කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. | ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් නිසි ලෙස සිදු නොකිරීම හේතුවෙන් කලා භවන නවීකරණය සඳහා රු. මිලියන 150 ක් ද ඇතුළුව මූලධන වැය විෂයයන් 2 ක් සහ පුනරාවර්තන වැය විෂයන් 04 කට අයත් වැඩසටහන් 09 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.මිලියන 168.9 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 164.98 ක් හෙවත් වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 97.7 ක් උපයෝජනය වී නොතිබුණි. | මෙම කාර්යය ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ඉටු කරවා ගැනීම සඳහා 2024.01.31 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අමාත්‍යාංශයේ නිරීක්ෂණ පදනම් ගනිමින් අමාත්‍ය මණ්ඩලයේ 2024.02.22 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2024 වර්ෂය සඳහා වැය විෂයය අංක 206-02-03-16-2001 යටතේ වෙන් වී ඇති රුපියල් මිලියන 155 ක ප්‍රතිපාදනය පූර්ණ වශයෙන් උපයෝජනය වන පරිදි හා රජයට ආර්ථික වාසියක් සිදු වන පරිදි ඉදිරි කටයුතු කරන බව දන්වා තිබුණි. | වාර්ෂික ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වැය විෂය අංක 206-2-02-2-1409 යටතේ සාහිත්‍ය තරඟාවලි සඳහා වෙන් කරන ලද රු.මිලියන 20 ක ප්‍රතිපාදනයෙන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සාහිත්‍ය උත්සව සඳහා රු.මිලියන 16.185 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණ ද, සත්‍ය වශයෙන් රු.මිලියන 8.531 ක් වැය වී තිබීමෙන් ඇස්තමේන්තුගත මුදල හා සත්‍ය වියදම වෙනස්වීමේ විචලතාවය සියයට 26 ක සිට සියයට 50 ක් දක්වා වූ අතර රු.මිලියන 7.654 ක අධි ඇස්තමේන්තු සකස් කර තිබීම ඊට හේතුව විය. | ජාතික සාහිත්‍ය උත්සවය පැවැත්වීම සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොමැති වීම සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ලිපියට අනුකූලතාවය දක්වමින් ජාතික සාහිත්‍ය උත්සවය නොපවත්වන ලද අතර 2022 වර්ෂයේ ඇස්තමේන්තුව පූර්වාදර්ශ කර ගනිමින් ඇස්තමේන්තු සකස් කිරීම හේතු කොට ගෙන අධි ඇස්මේන්තුවක් සකස්වීමක් පෙන්නුම් කරන බවත් ඉදිරි වර්ෂවලදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකරම් අනුවම පුරෝකථනයන් සිදු කර ඇස්තමේන්තු සකස් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බවත් දන්වා තිබුණි. | නිසි අධ්‍යනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 211(i) සහ මු.රෙ.447 ප්‍රකාරව සියලුම බැරකම් ඒවා සිදු වූ වහාම බැරකම් ලේඛනයේ සටහන් කළ යුතු වුවත් 2023 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 06 කට අදාළව 2024 වර්ෂයේදී ගෙවන ලද එකතුව රු.283,354 ක් බැඳීම් හා බැරකම් ලේඛනයේ සටහන් කර මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) බැරකම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි | මෙම වවුචර්පත් විවිධ ප්‍රායෝගික තත්ත්වයන් යටතේ 2023 දෙසැම්බර් මස ගිණුම් සැකසීමට පෙර ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම් සිදුවී ඇති බැවින් 2023 බැරකම් ලේඛනයට ඇතුලත් වී නොමැති නමුත් 2024 ට අදාළ වැය ලෙජරයන්හි 14 තීරයෙහි පෙර වර්ෂයේ බැඳීම් ලෙස නිසි පරිදි රු. 283,354 ක් වන වටිනාකම් සටහන් කර දක්වා ඇති බව දන්වා තිබුණි. | බැරකම් සිදු වූ වහාම බැරකම් ලේඛනයේ සටහන් කර මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර | දෙපාර්තමේන්තුව සඳහා වන අනුමත කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර විගණක තනතුර හා ගණකාධිකාරී තනතුරෙහි පවතින පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට අවස්ථා ගණනාවකදී ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ii) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | වර්තමානයේ පවතින චක්‍රලේඛයන් යටතේ නිලධාරීන් තාවකාලිකව සේවයෙන් බැහැරවීම් හා විශ්‍රාම යාම වැනි හේතු මත තොරතුරු පරීක්ෂා කිරීම සඳහා වැඩි කාලයක් ගත වීම හේතුවෙන් මෙම විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම ප්‍රමාද වී ඇති අතර, 2023 වර්ෂයට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 15 කට එම වර්ෂය තුළ දීම පිළිතුරු සපයා ඇති බවත්, ඉදිරියේදී එම ප්‍රමාදයන් වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවත් දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කිරීමට හා ඒ අනුව විගණන විමසුම් අවම කිරීමට කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| **(i)** | II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | | වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද, 2020 ඔක්තෝම්බර් මස සිට පුරප්පාඩුව පවතින දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තනතුර වැඩ බැලීමේ පදනමින් පවත්වාගෙන ගොස් තිබුණි. | දෙපාර්තමේන්තුව සඳහා වන අනුමත කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර විගණක තනතුර හා ගණකාධිකාරි තනතුරෙහි පවතින පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට අවස්ථා ගණනාවකදී ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | XXIV වැනි පරිච්ඡේදයේ 4.2, 4.5, 4.6 හා 6.3 වගන්ති | 846,073 | මියගිය, වැඩ තහනම් කළ, සේවය හැරගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 54 ක ගෙන් අයවිය යුතු වසර 05 ක් ඉක්මවා ඇති හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟහිටි ණය ශේෂ ආවරණය කර ගැනීම සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී මෙන්ම මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 188 හා 189 | 696,139 | 2017 සිට 2019 ජුනි දක්වා වූ කාලය තුළ තැන්පත් කරන ලද නිෂ්කාශනය නොවූ චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ පවතින තැන්පතු අතුරින් රු. 82,125 ක් වටිනා තැන්පතු 2023 දෙසැම්බර් මාසයේ දී ගිණුම් තැබීම් නිවැරදි කර ඇති අතර, ඉතිරි චෙක්පත් ආදායමෙන් ආපසු ගෙන ගිණුම් තැබීම් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලද පසු අදාළ නිවැරදි කිරීම් කඩිනමින් සිදු කිරීමට පියවර ගන්නා බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය | 591,160 | පැවරුණු කාර්යය අවසන් කළ වහාම අග්‍රිමය නැවත පියවිය යුතු වුවද අග්‍රිම පියවීමට දින 5 ක සිට දින 130 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | අතුරු අග්‍රිම ලබා දීමේදී හා පියවීමේදී ලෙජරයක් නඩත්තු වන අතර, ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි මේ වන විට එම ලේඛනය යාවත්කාලීන කර ගෙවීම් වවුචර් අංකය හා පියවීම් වවුචර් අංකය ද අදාළ ලේඛනයේ සටහන් කිරීමට පියවර ගෙන ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | 2,317,700 | අත්තිකාරම් පියවා නොතිබියදී අවස්ථා 74 ක දී නැවත අග්‍රිම ලබා දී තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 4,120,526 571 | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ කොන්ත්‍රාත් වලින් රඳවා ගන්නා ලද මුදල් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2015 සිට 2019 දක්වා කාලය තුළ, අදාළ කාර්යය අවසන් කර ඉදිරිපත් නොකළ හා ගෙවීමට නිර්දේශ නොලැබූ කොන්ත්‍රාත් මුදල් පසුවිපරම් කිරීමෙන් අනතුරුව රජයේ ආදායමට බැර කිරීමට ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා තිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් දක්වා වූ කාලය තුළ අවස්ථා 29 ක දී බැංකුව විසින් සෘජුව ගෙවන ලද එකතුව රු. 810,606 ක් හඳුනා ගැනීමට කටයුතු නොකර, හඳුනා නොගත් ගෙවීම් ලෙස සංශෝධිත මුදල් පොතට ගලපා තිබුණි. | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ බැංකුව විසින් සිදුකර ඇති ගෙවීම් හඳුනාගනිමින් ඒවා නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | බැංකුව විසින් සිදු කරන ලද සෘජු ගෙවීම් වහාම හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික සාහිත්‍ය උත්සවය, රාජ්‍ය සාහිත්‍ය උත්සවය හා ඊට ආදාළ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා රු.මිලියන 20 ක් වෙන්කර තිබුණ ද, එයින් රු.මිලියන 18ක් වැයකර රාජ්‍ය සාහිත්‍ය උත්සවය, | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් එවන ලද TO/BE1/04/01/01/(2023-101) හා 2023.09.12 දිනැති ලිපියට අනුකූලතාවය දැක්වීම හේතුවෙන් ජාතික සාහිත්‍ය උත්සවය පැවැත්වීමට | වැඩ සටහන් සඳහා වෙන් කරන ලද මුදල් උපරිම ඵලදායීතාවයකින් යුක්තව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සාහිත්‍ය උත්සව හා ප්‍රවර්ධන වැඩසටහන් පමණක් පවත්වා තිබුණු අතර ජාතික සාහිත්‍ය උත්සවය පවත්වා නොතිබුණි. | නොහැකි වීම නිසා රු.1,870,762 ක ප්‍රතිපාදනයක් ඉතිරි විය. නමුත් 2023 වර්ෂයට අදාළව ජාතික සාහිත්‍ය තරඟ විනිශ්චය කටයුතු මේ දිනවල සිදුකෙරෙමින් පවතින බව දන්වා තිබුණි. | |
| (ආ) | ජාතික කලා උළෙල වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 66 කින් ක්‍රියාකාරකම් 10 ක් ඉටු කිරීමට සැළසුම් කර තිබුණ ද, එයින් පෙර වර්ෂ දෙකෙහිද පවත්වා නොතිබුණු රු. මිලියන 8.7 ක ප්‍රතිපාදන වෙන් කළ රාජ්‍ය නර්තන උළෙල සහ රු. මිලියන 1.8 ක ප්‍රතිපාදන වෙන් කළ ප්‍රාදේශීය සංස්කෘතික සංගම් සහ කලායතන වැඩසටහන යන ක්‍රියාකාරකම් 2 ක ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම පෙර වර්ෂයන් දෙකෙහි ද පිළිවෙලින් රු.මිලියන 2.05 ක් හා රු.මිලියන 2 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන නොපැවත්වූ රාජ්‍ය සංගීත සම්මාන උළෙල සඳහා සමාලෝචිත වර්ෂයේදී ද රු.මිලියන 6 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන එම ක්‍රියාකාරකමෙහි හා රු.මිලියන 6 ක ප්‍රතිපාදන වෙන් කර ගත් රූපවාහිණී රාජ්‍ය සම්මාන උළෙලෙහි රු.මිලියන 1.4 ක වියදමකින් විනිශ්චය කටයුතු පමණක් සිදු කර තිබුණි. | රාජ්‍ය නර්තන උලෙළ, රාජ්‍ය සංගීත උලෙළ සහ රාජ්‍ය රූපවාහිනී සම්මාන උලෙළ යන උළෙලවල් පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර තිබුණ ද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2023.09.12 දිනැති ලිපිය හා ලබා දුන් උපදෙස් මත මෙම උලෙළවල් නොපැවැත්වූ බව දන්වා තිබුණි . | වැඩ සටහන් සඳහා වෙන් කරන ලද මුදල් උපරිම ඵලදායීතාවයකින් යුක්තව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු අතර ප්‍රතිපාදන වෙන්කිරීමේදී පසුගිය වර්ෂවල කරන ලද වෙන්කිරීම් පිළිබඳ සලකා බලා සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ලේඛකාධාර ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රු.මිලියන 3 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බව සඳහන් කරමින් එම වැඩසටහන නොපවත්වා එම ප්‍රතිපාදන ජාතික අත් පිටපත් තරඟයේ 2021 හා 2022 වර්ෂයන්ට අදාළ ජයග්‍රාහී අත් පිටපත් මුද්‍රණය කිරීම සඳහා සැළසුම් කළද අක් මුදල් නොලැබීම මත එම වැඩසටහන ද ක්‍රියාත්මක කර නොතිබුණි. | ලේඛකාධාර ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රු.මිලියන 3 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බව සඳහන් කරමින් එම වැඩසටහන නොපවත්වා එම ප්‍රතිපාදන ජාතික අත් පිටපත් තරඟයේ 2021 හා 2022 වර්ෂයන්ට අදාළ ජයග්‍රාහී අත් පිටපත් මුද්‍රණය කිරීම සඳහා සැලසුම් කළ ද අක්මුදල් නොමැතිවීම මත අදාළ කටයුත්ත සිදු කිරීමට නොහැකිව ඇත. 2024 වර්ෂයේ මෙම කාර්යය සඳහා මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | සැළසුම් සකස් කිරීමේදී ප්‍රතිපාදන ප්‍රමාණවත් වන අයුරින් සැළසුම් සකස් කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලේඛකාධාර ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් පොත් 10972 ක් සහ විකිණීම සඳහා මුද්‍රණය කරන ලද ගබඩාවේ ඉතිරි රු.27,867,824 ක් වටිනා භාෂා ත්‍රිත්වයෙන් හා වර්ග 166 කින් යුක්ත වූ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන පොත් 49,532 ක් ද වශයෙන් එකතුව පොත් 60,504 ක් පොත් ගබඩා තොග වාර්තා අනුව පැවතියද, එම පොත් නිසි පරිදි වර්ගීකරණය කර භෞතිකව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | එම පොත් නිසි පරිදි වර්ගීකරණය කර, නිසි ගණනය කිරීමක් කිරීමට පවත්නා සේවක සංඛ්‍යාව හා වියදම් කළමනාකරණය අනුව කටයුතු කිරීමේදී යම් අපහසුතා පැන නැගී ඇති නමුත් මෙම වර්ෂය තුළදී නිසි පරිදි පත් කරන ලද කමිටුවක් මාර්ගයෙන් භෞතිකව ගණනය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පොත් ගබඩාවේ පවතින සියළුම පොත් නිසිපරිදි වර්ගීකරණය කර භෞතිකව පවතින ශේෂය හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2024 ජුනි 18 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අත්තිකාරම් ගෙවීම් පරීක්ෂාව - 2023<br>(ආ) දෙපාර්තමේන්තු පොත් අලෙවිහලේ ආදායම පරීක්ෂාව - 2023<br>(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු පරීක්ෂාව - 2023<br>(ඈ) කෙටුම්පත් කාර්යසාධන වාර්තාව, වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම හා කාර්තුමය ප්‍රගති වාර්තා පිළිබඳ පරීක්ෂාව - 2023<br>(ඉ) මූල්‍ය ප්‍රකාශන විගණනය 2023 | වර්තමානයේ පවතින චක්‍රලේඛයන් යටතේ නිලධාරීන් තාවකාලිකව සේවයෙන් බැහැරවීම් හා විශ්‍රාම යාම වැනි හේතු මත තොරතුරු පරීක්ෂා කිරීම සඳහා වැඩි කාලයක් ගත වීම හේතුවෙන් මෙම විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම ප්‍රමාද වී ඇති අතර, 2023 වර්ෂය අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 15 කට එම වර්ෂය තුළ දීම පිළිතුරු සපයා ඇති බවත්, ඉදිරියේදී එම ප්‍රමාදයන් වළක්වා ගැනීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇති බවත් දන්වා තිබුණි. | නියම කරන ලද කාලය තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමට කටයුතු කළ යුතුය. |

### 3.3 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 වර්ෂයේ පවත්වන ලද ජාතික අත්පිටපත් තරඟයේ ජයග්‍රාහී අත්පිටපත් මුද්‍රණය සඳහා පළමු වරට සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී අත්පිටපත් 3000 ක් රු.364,650 ක මුදලකට සිදුකරවා ගැනීමට තිබුණු අවස්ථාව එම ක්‍රියාවලියේ සිදුවී තිබුණු අක්‍රමිකතා හේතුවෙන් අතරමඟ නවතා තිබුණු අතර 2023 වර්ෂයේ ජනවාරි මස නැවත දෙවන වර මිල කැඳවීමේ දී පොත් | 2016 වර්ෂයේ ජයග්‍රාහී අත්පිටපත් එම වර්ෂය තුළදීම මුද්‍රණය කිරීමට කාල පරාසය ප්‍රමාණවත් නොවී ඇත. ඒ අනුව 2016 වසර අවසානයට පෙර මුද්‍රණය කිරීමට නොහැකි වීමත් 2017 වරෂයේදී මෙම කාර්යය ඉටු කළ යුතු වුවත් මේ සඳහා ප්‍රතිපාදන නොතිබීමත්, 2018 වර්ෂයේ දී මෙම කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණ ද විවිධ හේතූන් නිසා මුද්‍රණ කාර්යය ප්‍රමාදවී ඇති බවත් දන්වා තිබුණි. | සැළසුම් සහගතව ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 3000 සඳහා රු. 1,079,500 ක් ගෙවා වසර 7 කට පසු සිදුකර ගෙන තිබුණි. ඒ අනුව පළමුවර සිදුකරවා ගැනීමට තිබුණු අවස්ථාව අහිමි කර ගැනීම නිසා රු.714,850 ක මූල්‍ය අලාභයක් දැරීමට සිදුවී තිබුණි. | | |
| (ආ) | ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය කර සංවර්ධනය කිරීමේ අදියර I ට අදාළ කොන්ත්‍රාත්කරු විසින් වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව එනම් 2018 නොවැම්බර් 24 දින ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැඟිල්ල භාර දී තිබුණ ද, ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද රු.38,658,734 ක මුදල නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර එම මුදල නැවත ගෙවන ලෙස 2021 මැයි 10 දින කොන්ත්‍රාත්කරුට දැනුම් දී තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වාම එම මුදල අය කර ගෙන නොතිබුණි. | මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට කරුණු යොමු කර ඇති අතර ඉදිරියේදී ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානය වෙතද දෙපාර්ශවය කැඳවීමට නියමිත බව දන්වා තිබුණි. | කඩිනමින් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයකු පත් කර අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සඳහා වන අනුමත කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර විගණක තනතුර හා ගණකාධිකාරී තනතුරෙහි පවතින පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට අවස්ථා ගණනාවකදී ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |